# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂි තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි.

තාක්ෂණික පත්‍රිකා අංක 10 - 2018 අගෝස්තු

## සීඝ්‍රයෙන් පැතිර යන දුඹුරු පැළ කීඩෑ හා පිට සුදු පැළ කීඩෑ හානියෙන් කෙත රැක ගනිමු........

ලංකාවේ මේ වනවිට අම්පාර, ගම්පහ, කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්ගේ ප්‍රදේශ කිහිපයක ප්‍රධාන වශයෙන් දුඹුරු පැළ කීඩෑ හානිය ද, ඒත් සමඟම පිට සුදු පැළ කීඩෑ හානියද වාර්තා වේ. පවතින කාලගුණික තත්ත්වය හා පාරිසරික තත්ත්වයන් අනුව ඉතා ඉක්මනින් මෙම හානිය පැතිරයාමේ අවදානමක් පවතියි.

බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කීට විද්‍යා අංශයත්, ව්‍යාප්ති නිලධාරීනුත් සමඟ අම්පාර දිස්ත්‍රික්කයේ උහන, මායාදුන්න යන ප්‍රදේශයන්හි ගොවි ක්ෂේත්‍ර වල මෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රදේශ කිහිපයකුත් පරීක්ෂා කර පහත කරුණු අනාවරණය කරගන්නා ලදි.

1. අම්පාර දිස්ත්‍රික්කයේ නිරීක්ෂණය කරන ලද ප්‍රදේශයන්හි වාරි ජලය අවස්ථා පහක නිකුත් කරඇති අතර වයස් කාණ්ඩ පහකට අදාළ වන පරිදි වී වගාව විවිධ අවස්ථා වල පැවතීම.
2. ගොවීන් බහුතරයක් විසින් පැළමැක්කා පාලනය සඳහා වඩාත් උචිත බීජ ප්‍රතිකාර ක්‍රමය භාවිතා කර නොතිබූ අතර පැළ මැක්කාගේ හානිය පාලනය සඳහා වගාවට මුල් අවස්ථාවේදී වැඩිපුර කෘමිනාශක භාවිතා කිරීම තුළින් පරිසර තුල්‍යතාවය බිඳවැටී ඇති බව.
3. අක්කරයක් සඳහා නිර්දේශිත බීජ ප්‍රමාණයට වැඩිපුර යොදා තිබීම නිසා වැඩි පැළ ගහණයක් පැවතීම.
4. මේ දිනවල පවතින උෂ්ණත්වය, ආර්ද්‍රතාවය හා සුළං තත්ත්වය දුඹුරු පැළ හා පිට සුදු පැළ කීඩෑ හානිය හා ඔවුන්ගේ ගහණය ඉහළ යාමට හිතකර ලෙස පැවතීම.
5. ගොවීන් කීඩෑ පිළිස්සුම් තත්ත්වය දක්වා එනතෙක් මෙම හානිය හඳුනාගැනීමට අපොහොසත් වීම.
6. අවස්ථාවට වඩාත් සුදුසු කෘමිනාශක තෝරාගැනීමට නොහැකි වී තිබීම. තවද කෘමිනාශක වර්ග කිහිපයක් එකට මිශ්‍ර කර යෙදීම සිදුකර තිබීම.
7. කෘමිනාශක යොදන ආකාරය නිවැරදි නොවීම හා අවශ්‍ය කෘමිනාශක ප්‍රමාණය නිවැරදි ලෙස භාවිතා නොකිරීම (ගොයම් ඉහළ කොටස් වලට පමණක් කෘමිනාශක යෙදීම).
8. භූමිතෙල් සහ වැලි මිශ්‍රකර යෙදීම. දුව තෙල් යෙදීම, රතිඤ්ඤා පත්තු කිරීම වැනි ඉතාමත් පරිසර හානිදායක ක්‍රියා අනුගමනය කර තිබීම.

**ඉහත සඳහන් කරුණු පාදක කොටගෙන මෙම දුඹුරු පැළ හා පිට සුදු පැළ කීඩෑ හානිය වඩාත් උග්‍ර තත්ත්වයකට පත්වී ඇති අතර එය වසංගත මට්ටමක් දක්වා පැමිණ පවතියි**

මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා පහත සඳහන් ක්‍රම අනුගමනය කිරීම වඩාත් සුදුසු බව පෙන්වා දියහැක.

1. දිනපතා කුඹුරට ගොස් ක්ෂේත්‍රය තුළ සෑම ස්ථානයක්ම නියෝජනය වන පරිදි කුඹුරට බැස ගොයම් ගසේ පාදස්ථය දක්වා පරීක්ෂා කිරීම.
2. හානියේ ස්වභාවයෙන් නොව කීඩෑවන් නිරීක්ෂණය තුළින් මූලිකම අවස්ථාවේදී හානිය හඳුනාගැනීම.

3. ප්‍රායෝගිකව කළහැකි අවස්ථාවන් වලදී ජලය කපා හැරීම.

4. හානියේ විවිධ අවස්ථාවන්ට අනුකූලව නිර්දේශිත වඩාත් සුදුසු කෘමිනාශකය තෝරාගැනීම (හානියේ මූලික අවස්ථාවේදී කෘමි වර්ධක නිශේධක කාණ්ඩයට අයත් කෘමිනාශක යෙදීම සහ හානිය වඩාත් උග්‍ර වූ අවස්ථාවලදී දෙවන කාණ්ඩයට අයත් පුළුල් ක්‍රියාකාරී කෘමිනාශකයක් යෙදීම මෙම අවස්ථාවට අනුව වඩාත් සුදුසු වේ. තවද කෘමිනාශක එක වරකට වඩා යෙදීමට අවශ්‍ය වුවහොත් නිර්දේශයට අනුව වෙනත් ක්‍රියාකාරී කාණ්ඩයකට අයත් කෘමිනාශක යෙදීම සුදුසු වේ).

**නිර්දේශිත කෘමිනාශක**

| රසායනික නම | වෙළෙඳ නාමය | ප්‍රමාණය/හෙක් |
|---|---|---|
| Buprofezin 10% WP | Applaud 10 WP | 192-240 g |
| Ethiprole 10% SC | Cubrix 100 SC | 480-600 ml |
| Thiocyclam 50% SP | Evisect | 1000 g |
| Sulfloxyflor 50% WG | Transform | 100 g |
| Clothianidin 15% SG | - | 80-100 ml |
| Etofenprox 10 EC | Trebon | 480-600 ml |
| Carbosulfan 20 SC | Marshal 20 | 800-1000 g |

මීට අමතරව පහත සඳහන් නිර්දේශිත කෘමිනාශක ද යෙදිය හැක.

Thiamethoxam 25% WG

Imidacloprid 70% WG

Imidacloprid 200g/ℓ SL

Acetamiprid 20% SP

Chlorantraniliprole 20% + Thiamethoxam 20% WG

Buprofezin 25% SC

Novaluron 100g/ℓ EC

Fipronil 50g/ℓ SC

Imidacloprid 200g/ℓ OD

Thiocyclam (hydrogen oxalate) 4% GR

5. නැප්සැක් දියර ඉසිනයක් සහ හෙලෝ කෝන් නොසලය භාවිතා කරමින් විශේෂයෙන් කඳ පාදස්ථය සහ අනෙකුත් සියලුම කොටස් හොඳින් ආවරණය වන පරිදි කෘමිනාශක දියර ඉසීම. පීදීම අවසන් වූ වගාවේ ක්ෂේත්‍රය අඩි තුනක් පමණ පරතරයකින් තීරු ලෙස දෙපසට යොදා කෘමිනාශක යෙදීම වඩාත් නිවැරදි හා සාර්ථක ප්‍රතිඵල ලබාදෙයි.

6. කීඩෑ හානිය සඳහා පළිබෝධනාශක යෙදීමේදී පවතින වසංගත තත්ත්වය යටතේ ප්‍රමාණවත් තරම් කෘමිනාශක යෙදීම සිදු කළයුතු වීම.

7. **යායේ සියලුම ගොවීන්**, යම් මට්ටමකින් හෝ කීඩෑවන් සිටීනම් මෙම අවස්ථාවේදී පවතින තත්ත්වය සලකා බලා කෘමිනාශක දියර යායක් ලෙස එකවර යෙදීම වාසිදායක වේ. කෘමිනාශක දියර ඉසීමෙන් පසු නිරන්තරයෙන් (දිනපතා) ක්ෂේත්‍රය පරීක්ෂාවට ලක් කිරීම. එම අවස්ථාවේදී නැවතත් සතුන් නිරීක්ෂණය වේ නම් එම අවස්ථාවට වඩාත් සුදුසු කෘමිනාශකයක් නැවත යෙදීම.

8. නිර්දේශයෙන් පරිබාහිර කිසිදු කෘමිනාශක වර්ගයක් හෝ වෙනත් ද්‍රව්‍යයක් නොයෙදීම.

9. මෙවැනි අධික හානිදායක මට්ටමකදී සාර්ථක මැඩ පැවැත්වීමක් සඳහා ගොවි මහතුන්ගේ අත්දැකීම පමණක් ප්‍රමාණවත් නොවන අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහාය ලබා ගැනීම ඉතා වැදගත් බව අනාවරණය කර සිටිමු.

2016/2017 ගම්පහ, කුරුණෑගල, අම්පාර, රත්නපුර, පොළොන්නරුව හා මාතර ප්‍රදේශ වලින් කීඩෑ හානිය වාර්තා වූ අතර ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වසංගත මට්ටම දක්වා පැතිර යන ලදි.

එම අවස්ථාවේ සම්පූර්ණ කීඩෑ ගහණය විනාශ නොවීම ද මෙම තත්ත්වය ඇතිවීමට හේතු සාධක වන්නට ඇත. තවද මෙම කීඩෑ උවදුර ඇතිවීම වැළැක්වීම සඳහා ගන්නා ලද උත්සාහයන් තවදුරටත් වැඩි කළයුතු අතර රසායනික නොවන ක්‍රමවේදයන් කන්නයේ මුල සිටම අනුගමනය කිරීම තුළින් මෙවැනි තත්ත්වයන් ඇතිවීම අවම කළහැකි බව අවධාරණය කරන්නෙමු.

**තාක්ෂණික කරුණු : පී.ඩී.එස්.එන් චන්ද්‍රසේන (ප්‍රධාන කීට විද්‍යාඥ) - වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය**

**එස්.ආර්. සරත්චන්ද්‍ර (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - පර්යේෂණ) - වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය**

**හරිත නිමලරත්න (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - සංවර්ධන) - පැළෑටි සංරක්ෂණ සේවය**

---

පරිගණක සැකසුම : ගෝතමී ලියනගේ

සැකසුම : කේ.එම් සිරිවර්ධන (තාක්ෂණික සහකාර - කෘෂි ව්‍යාප්ති)

අධීක්ෂණය හා උපදෙස් : එස්. පෙරියසාමි (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)